**අම්බලන්ගොඩ නගර සභාව - 2021**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

අම්බලන්ගොඩ නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා, මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 2021 වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | | |
| (ii) බස් නැවතුම්පොල ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල සඳහා ගෙවිය යුතු මුළු ණය පොලී මුදල රු.40,528,326 ක් වුවද, එය රු.40,629,369 ක් ලෙස රු.101,043 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | | |
| (iii) බස් නැවතුම්පොල ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය මුදල සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ ණය මුදල රු.23,467,280 ක් වුවද, එය රු.24,045,056 ක් ලෙස රු.577,776 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ. |
| (iv) යන්ත්‍ර හා උපකරණ ලබා ගැනීම සඳහා 1998 වර්ෂයේ දී ලබාගත් ණය මුදල සඳහා 2019 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.1,888,533 ක පොලී මුදල ගිණුම් ගතකර නොතිබුණි. | | |
| (v) නගර සභාව සතු නාගරික ක්‍රීඩාංගණයේ කොටසක් ක්‍රීඩා සමාජයකට බදු දීම වෙනුවෙන් ලැබිය යුතු බදු කුලිය හා ජල ගාස්තු ගණනය කර, ගිණුම් ගතකර නොතිබුණි. | | |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු.4,205,739 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.7 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ලැබිය යුතු ගිණුම්** | | |
| ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 1983 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින විදුලිබල වන්දි ගිණුම, හිඟහිටි තානායම් කුලී ගිණුම, හිඟහිටි විනෝද බදු ගිණුම, හිඟහිටි දැන්වීම් පුවරු ගාස්තු යන ගිණුම් වල එකතුව රු.15,895,690 ක් වූ ලැබිය යුතු ශේෂ 04 අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ත් කටයුතු කර නොතිබුණි. | තොරතුරු පරීක්ෂා කර බලා අයකර ගැනීමට කටයුතු කරමි. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,006,166 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.23,386,431 විය.

### 2.2 ආදායම් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ඒකක 10762 කින් අයවිය යුතු මුළු හිඟ වරිපනම් හා බදු ශේෂය රු.35,098,989 ක් විය. මෙම හිඟ මුදල තුළ රු.100,000 ට වැඩි වරිපනම් බදු හිමියන් 39 | ජංගම වැඩසටහන් පවත්වා හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ශේෂ අයකර ගත යුතු වේ. |

දෙනෙකුගෙන් රු.8,014,482 ක හිඟ ශේෂයක් පැවතුණි. ආදායම් පරීක්ෂක නිලධාරීන් තුන් දෙනෙකු සේවයේ යොදවා තිබූ නමුත්, ආදායම් අයකර ගැනීමට ලිපි මගින් දැනුවත් කිරීම පමණක් සිදුකර තිබුණි.

**(ආ) කුලී**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු හිඟ බදු කුලී ශේෂය රු.3,438,639 ක් විය. වෙළඳ සංකීර්ණ 09 ටම අදාළව කඩ කාමර ගිවිසුම් 188 අළුත් කර නොතිබුණු අතර, කඩ කාමර දීර්ඝ කාලයක් තිස්සේ අළුත්වැඩියා කිරීමකින් තොරව කුලියට ලබා දී තිබුණු අතර, භාවිතයට ගත නොහැකි ආකාරයට අබලන්ව හා අපිරිසිදු තත්ත්වයේ පැවතුණි. | ගිවිසුම අළුත් කර හිඟ ශේෂ අයකර ගැනීමටත්, නව වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමටත් සැලසුම් කරමි. | ගිවිසුම් අළුත් කර හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |
| සභාව විසින් දිනකට දිරන හා නොදිරන කසළ ටොන් 18 – 20 අතර ප්‍රමාණයක් එකතු කර හල්වතුර ඉඩමේ ගොඩගසා තුනී කර පස් දමා වසා දැමීමට කටයුතු කරනු ලබන අතර, කසළ සම්බන්ධයෙන් සභාවට දිගුකාලීන වැඩ පිළිවෙලක් නොතිබුණි. තවද, 2017 වර්ෂයේ දී රු.353,948 ක මුදලක් වැය කරන ලද කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ද අවසන් කර නොතිබුණි. | කසළ කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරමි. | විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. |
| **(ආ) අයවැය ලේඛනය** | | |
| (i) අම්බලන්ගොඩ නගර සභාවේ 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අයවැය ලේඛනය සභාවේ දී සම්මත නොවුනු අතර, ඒ සම්බන්ධ පළාත් පාලන කොමසාරිස්ගේ 4/03/09/2 අංක හා 2021 ජනවාරි 20 දිනැතිව එවන ලද ලිපිය අනුව, 2021 වර්ෂයට අදාළව ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය සභා සම්මත වීම පිළිබඳව ගැටළුවක් පැන නොනගින බව නිරීක්ෂණය කර ඇත. | අනුමත කර ගැනීමට කටයුතු කරමි. | නගර සභා ආඥා පනත ප්‍රකාරව අයවැය ලේඛනය අනුමත කර ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| (ii) මේ සම්බන්ධයෙන් නගර සභාවේ මන්ත්‍රීවරුන් බලපිටිය මහාධිකරණයේ නඩු පවරා තිබූ අතර, 2021 වර්ෂය සඳහා වන අයවැය ලේඛනය නගර සභා ආඥා පනත යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව සහ නිසි නෛතිකමය ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් නීත්‍යානුකූලව සම්මත කර ගන්නා ලෙසට 2022 ජූලි 29 දින බලපිටිය මහාධිකරණය විසින් නියෝග කර ඇත. | අනුමත කර ගැනීමට කටයුතු කරමි. | නගර සභා ආඥා පනත ප්‍රකාරව අයවැය ලේඛනය අනුමත කර ගත යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **සභාව සමඟ ගිවිසුම්ගත වීම** | | |
| නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 227(1) වගන්තියට පටහැනිව නාගරික මන්ත්‍රීවරයෙකු විසින් 1990 වර්ෂයේ සිට කඩ කාමර 02 ක් කුලියට ගැනීම වෙනුවෙන් සභාව සමඟ ගිවිසුම් ගත වී තිබුණි. | 2022 පෙබරවාරි 14 දින සිට 2267/4 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් නිවේදනය කර, ඉවත් කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |